# අ.පො.ස. (උ.පෙළ) විභාගය 2017 අගෝස්තු

## අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා විභාග අයදුම්කරුවන්ට උපදෙස්

අංක 1 : **තෝරාගත් දිස්ත්‍රික්කය, නගරය සහ නගර අංකය :**

ඔබ විභාගයට පෙනී සිටීමට තෝරාගත් දිස්ත්‍රික්කය සඳහන් කරන්න. මෙම විභාගය පවත්වනු ලබන නගර අංක වෙනස් කර ඇති බැවින් ඒ ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. ඔබ විභාගයට පෙනී සිටීමට තෝරාගත් නගරය සහ ඊට අදාළ නගර අංකය මෙම කොටුවෙහි සඳහන් කළ යුතුය. වැරදි නගර අංකයක් ඔබ විසින් සඳහන් කිරීමෙන් ඉතා දුර විභාග මධ්‍යස්ථානයක් ලැබීමට ඉඩ ඇත. අදාළ නගර හා නගර අංක සහිත ලේඛනයක් මේ සමග අමුණා ඇත.

අංක 2 : I සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලියන්න

උදහරණ : **KULASURIYAGE MAHESH SUJITH DE SILVA**

මුලකුරු සමග නම නොලියන්න.

II සම්පූර්ණ නම සිංහලෙන් ලියන්න.

උදහරණ : කුලසූරියගේ මහේෂ් සුජිත් ද සිල්වා

අංක 3 : ලිපිනය (i) ඉංග්‍රීසියෙන් ද (ii) සිංහලෙන් ද ලියන්න.

මෙහි ස්ථිර ලිපිනය සඳහන් කරන්න. කිසි විටෙකත් තාවකාලික පදිංචි ස්ථානයේ ලිපිනය නොලියන්න. ඔබගේ දුරකථන අංකය අදාළ කොටුවේ ලියන්න.

අංක 4 : උප්පැන්න සහතිකය අනුව උපන් දිනය ලියන්න.

අංක 5 : 2017 වර්ෂයට පෙර ව්‍යාපෘති හා ප්‍රායෝගික පරීක්ෂණ සම්පූර්ණ කර අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා විභාග අංකය සඳහන් කරන්න.

අංක 6 : **භාෂා මාධ්‍යය :**

පෙනී සිටින භාෂා මාධ්‍යය දැක්වීම සඳහා අදාළ කොටුවේ (x) කතිරයක් යොදන්න.

**උදා :**

| ☒ 2 | 3 | 4 |
|---|---|---|
| **සිංහල** | **දෙමළ** | **ඉංග්‍රීසි** |

අංක 7 : 2017 වසරේදී විභාගයට පෙනී සිටීමට නියමිත විෂයන් හා පෙනී සිටින මාධ්‍යය.

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 2009/16 හා 2009/16(i) දරන චක්‍රලේඛවලට අනුගත සංශෝධනවලට අනුකූලව විෂයයන් තෝරා ගත යුතුයි. එම චක්‍රලේඛවලට පටහැනිව විෂය සංකලන තෝරා ගැනීමෙන් අයදුම්කරුවන්ට මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා පිළිබඳව වගකීමක් නොමැති බව කාරුණිකව සලකන්න. මෙම අයදුම්කරුවන්ට මෙම නිවේදනයේ දක්වා ඇති විෂයය ලේඛනයෙන් තම විෂයයන් තෝරා ගත හැකිය. මෙම විභාගය සඳහා හර විෂයන් තුනක් තෝරාගත යුතු අතර, **විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට අදහස් කරනු ලබන්නේ නම් සාමාන්‍ය පොදු පරීක්ෂණයට ද පෙනී සිට සමත් විය යුතුයි.** ඉහත විෂයන්ට අමතරව විෂයය අංක 13 සාමාන්‍ය ඉංග්‍රීසි විෂයට ද ඉල්ලුම් කළ හැකිය.

**වැදගත් : එක් එක් විෂයට පෙනී සිටින මාධ්‍යය සඳහන් කිරීමේදී සිංහල නම් 2 ද, දෙමළ නම් 3 ද, ඉංග්‍රීසි නම් 4 ද අදළ කොටු තුළ සඳහන් කරන්න.**

**උදහරණ :**

| **විෂය :** | **මාධ්‍යය** | **විෂය අංක** |
|---|---|---|
| භෞතික විද්‍යාව | 2 | 01 |
| රසායන විද්‍යාව | 2 | 02 |
| ජීව විද්‍යාව | 4 | 09 |
| සාමාන්‍ය පොදු පරීක්ෂණය | 2 | 12 |
| සාමාන්‍ය ඉංග්‍රීසි | | 13 |

**අයදුම්කරුවකුට පෙනී සිටිය හැකි උපරිම විෂයන් ගණන 05 කි.**

**ඉතා වැදගත් :**

i. භෞතිය විද්‍යා විෂය ධාරාව යටතේ 07 ගණිතය විෂයට ඉල්ලුම් කළ නොහැකිය.

ii. විෂය අංක 14, 15, 16, 17, 18 හා 19 යන විෂයයන් අතුරින් **එක්** විෂයකට පමණක් ඉල්ලුම් කළ හැකිය.

iii. (65) ඉංජිනේරු තාක්ෂණවේදය හා (66) ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂයයන් දෙකෙන් ඉල්ලුම් කළ හැක්කේ **එක්** විෂයකට පමණි.

iv. (67) තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයට ඉල්ලුම් කළ හැක්කේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය හෝ ඉල්ලුම් කරන්නේ නම් පමණි.

v. ආගම් හා ශිෂ්ටාචාර විෂයන් අතරින් යම් ආගමක් තෝරා ගන්නේ නම් ඊට අදළ ශිෂ්ටාචාර විෂය තෝරාගත නොහැකිය. එසේම ශිෂ්ටාචාර විෂයන් තෝරා ගන්නේ නම් ඊට අදළ ආගම විෂය තෝරාගත නොහැකිය.

vi. 52 නර්තනය විෂය ඉල්ලුම් කිරීමේදී ඔබ ඉගෙනුම ලැබූ නර්තන වර්ගය සඳහන් කරන්න.

**උදා :** ඔබ ඉගෙනුම ලැබුවේ උඩරට නර්තනය නම් 52 A ලෙස, පහතරට නර්තනය නම් 52 B ලෙස සබරගමු නර්තනය නම් 52 C ලෙස වශයෙනි.

**මෙම වෙන් කර ගැනීම ප්‍රායෝගික පරීක්ෂණවලට පමණක් අදළ වේ. ප්‍රවේශ පත්‍රයේ හා ප්‍රතිඵල ලේඛනයේ සඳහන් වනුයේ 52 නර්තනය (දේශීය) ලෙසය.**

vii. ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද විෂයන් පසුව වෙනස් කිරීමට හෝ විභාග ශාලාවේ දී විෂයන් මාරු කිරීමට හෝ අමතර විෂයන්ට පෙනී සිටීමට හෝ ඉඩ දෙනු නොලැබේ. යම් හෙයකින් එසේ පෙනී සිටියහොත් එම අයදුම්කරුගේ ප්‍රතිඵල අවලංගු කිරීමට සිදුවනු ඇත.

## විෂයය ලේඛනය

| **විෂයය** | **විෂය අංකය** | **විෂය** | **විෂය අංකය** |
|---|---|---|---|
| භෞතික විද්‍යාව | 01 | ආහාර තාක්ෂණවේදය | 17 |
| රසායන විද්‍යාව | 02 | කෘෂි තාක්ෂණවේදය | 18 |
| ගණිතය | 07 | ජෛව සම්පත් තාක්ෂණවේදය | 19 |
| කෘෂි විද්‍යාව | 08 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 20 |
| ජීව විද්‍යාව | 09 | ආර්ථික විද්‍යාව | 21 |
| සංයුක්ත ගණිතය | 10 | භූගෝල විද්‍යාව | 22 |
| උසස් ගණිතය | 11 | දේශපාලන විද්‍යාව | 23 |
| * සාමාන්‍ය පොදු පරීක්ෂණය | 12 | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | 24 |
| * සාමාන්‍ය ඉංග්‍රීසි | 13 | ඉන්දීය ඉතිහාසය | 25A |
| සිවිල් තාක්ෂණවේදය | 14 | යුරෝපා ඉතිහාසය | 25 B |
| යාන්ත්‍රික තාක්ෂණවේදය | 15 | නූතන ලෝක ඉතිහාසය | 25 C |
| විදුලිය, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු | | ගෘහ ආර්ථික විද්‍යාව | 28 |
| තාක්ෂණවේදය | 16 | සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | 29 |

## විෂය ලේඛනය

| **විෂය** | **විෂය අංකය** | **විෂය** | **විෂය අංකය** |
|---|---|---|---|
| ව්‍යාපාර සංඛ්‍යානය | 31 | බටහිර සංගීතය | 56 |
| ව්‍යාපාර අධ්‍යයනය | 32 | නාට්‍ය හා රංග කලාව (සිංහල) | 57 |
| ගිණුම්කරණය | 33 | නාට්‍ය හා රංග කලාව (දෙමළ) | 58 |
| බුද්ධ ධර්මය | 41 | නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) | 59 |
| හින්දු ධර්මය | 42 | ඉංජිනේරු තාක්ෂණවේදය | 65 |
| ක්‍රිස්තියානි ධර්මය | 43 | ජෛව පද්ධති තාක්ෂණවේදය | 66 |
| ඉස්ලාම් | 44 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | 67 |
| බෞද්ධ ශිෂ්ටාචාරය | 45 | සිංහල | 71 |
| හින්දු ශිෂ්ටාචාරය | 46 | දෙමළ | 72 |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | 47 | ඉංග්‍රීසි | 73 |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | 48 | පාලි | 74 |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | 49 | සංස්කෘත | 75 |
| චිත්‍ර කලාව | 51 | අරාබි | 78 |
| නර්තනය (දේශීය-උඩරට) | 52A | මැලේ | 79 |
| නර්තනය (දේශීය-පහතරට) | 52B | ප්‍රංශ | 81 |
| නර්තනය (දේශීය-සබරගමු) | 52C | ජර්මන් | 82 |
| නර්තනය (භරත) | 53 | රුසියන් | 83 |
| පෙරදිග සංගීතය | 54 | හින්දි | 84 |
| කර්ණාටක සංගීතය | 55 | චීන | 86 |
| | | ජපන් | 87 |

* ප්‍රධාන විෂය ගණයට අයත් නොවේ. පෙනී සිටින්නේ නම් පමණක් විෂය අංකය කොටුව තුළ ලියන්න.

අංක 8 : ඉල්ලුම්කර ඇති විෂයන් ගණන පැහැදිලිව ඉලක්කමෙන් ලියන්න.

අංක 9 : ජාතික හැඳුනුම්පතේ අංකය ලියා එහි ජායා පිටපතක් අදළ කොටුවේ අලවන්න. මෙම ජාතික හැඳුනුම්පතෙහි ජායා පිටපත නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව ද වැඩි දුරටත් දන්වමි.

අංක 10 : ගෙවන ලද විභාග ගාස්තුව අකුරෙන් හා ඉලක්කමෙන් ලියන්න.

අංක 11 : ස්ත්‍රී / පුරුෂ භාවය

ස්ත්‍රී / පුරුෂ භාවය දැක්වීම සඳහා අදළ කොටුවේ (x) කතිරයක් යොදන්න.

අංක 12 : ඔබ විභාගයට පෙනී සිටින්නේ කී වෙනි වතාවට දැයි සඳහන් කරන්න.

අංක 13 : වයස අවුරුදු 21 ට අඩු බාහිර අයදුම්කරුවන් සඳහා නියමිත පාසල් පදනම් කරගත් ඇගයීමට විකල්ප වැඩ පිළිවෙළ සඳහා ලියාපදිංචි වී ඇත්නම් අංකය හා ලියාපදිංචි වූ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහන් කරන්න.

අංක 14 : **හඳුනාගැනීමේ සහතිකය**

පෞද්ගලික අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍රයේ අත්සන සහතික කළ යුත්තේ, තමා පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් පමණි. ඒ සඳහා ජාතික හැඳුනුම්පත හා එහි ජායා පිටපතක් රැගෙන යා යුතුය.

අංක 15 : **ගෙවන ලද ගාස්තු**

විභාග ගාස්තු ගෙවිය යුත්තේ **මුද්දර** වලින් හෝ **මුදල් ඇණවුම්** වලින් නොවේ. විභාග ගාස්තුව වශයෙන් නියමිත මුදල ළඟම ඇති ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගත් කුවිතාන්සිය අංක 15 හි ඇලවිය යුතුයි. 2017 ජනවාරි 23 වැනි දින සිට පෙබරවාරි 15 වන දින දක්වා දිවයිනේ සියලුම තැපැල් / උප තැපැල් කාර්යාලයන්හි මෙම කුවිතාන්සි නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදන ලෙස තැපැල්පති වෙත දන්වා යවා ඇත.

**විභාග ගාස්තු විස්තර පහත දැක්වේ.**

| **විෂය ගණන** | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| **ගාස්තුව** | 150/- | 200/- | 250/- | 350/- | 400/- |

**ගෙවූ ගාස්තු පිළිබඳ කුවිතාන්සිය :**

මුදල් ගෙවූ බවට නිකුත් කර ඇති කුවිතාන්සිය නොගැලවෙන පරිදි නියමිත කොටුව තුළ අලවන්න.

**(මුදල් ගෙවූ කුවිතාන්සියේ අංකය, දිනය අයදුම්කරු විසින් ලියා තබා ගැනීම මැනවි. එහි ජායා පිටපතක් තබා ගැනීම වඩාත් යෝග්‍යය)**

**ගෘහ ආර්ථික විද්‍යාව, විෂයට රු. 300/- ක්ද, ඉංජිනේරු තාක්ෂණවේදය හා ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයන්ට රු. 300/- බැගින් ද ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ගාස්තු ගෙවිය යුතුය. එම මුදල ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබූ විට පමණක් ගෙවිය යුතු ය.**

අංක 16 : **අයදුම්කරුගේ සහතිකය**

සුපරීක්ෂාකාරීව කියවා බලා මෙහි අයදුම්කරුගේ අත්සන යෙදිය යුතුය.

**දෘෂ්‍යාබාධිත / ශ්‍රවණාබාධිත / වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කරන** අයදුම්පතේ වම් පස උඩ කෙළවරෙහි රතු පාටින් **"දෘෂ්‍යාබාධිත / ශ්‍රවණාබාධිත / වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම :**

1. අංක 01 සිට අංක 13 දක්වා විස්තර අයදුම්පත්‍රයේ පළමු පිටුවේ සඳහන් කළ යුතුය. **එලෙස සකස් නොකරන ලද අයදුම්පත් ද, උපදෙස්වලට පටහැනි ලෙස සකස් කර එවන අයදුම්පත් ද නියමිත දිනට පසුව තැපැල් කරන අයදුම්පත් ද විභාග ගාස්තු මුද්දර වලින් හෝ මුදල් ඇණවුම් වලින් හෝ ගෙවා ඇති අයදුම්පත් ද ප්‍රතික්ෂේප කෙරේ.**

2. පෞද්ගලික අයදුම්කරුවන් ලෙස ඉල්ලුම් කළ හැක්කේ පාසලෙන් අස්වී ඇති අයදුම්කරුවන්ට පමණි. **පාසලේ ඉගෙන ගනිමින් ම පෞද්ගලික අයදුම්කරුවන් ලෙස පෙනී සිටින අයදුම්කරුවන් විභාග තහනමකට ලක් කෙරෙනු ඇත.**

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2017
# විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර

### කොළඹ දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| කොටහේන | 01 |
| මරදාන | 02 |
| බොරැල්ල | 03 |
| මාලිගාවත්ත | 04 |
| කොලොන්නාව | 05 |
| කුරුඳුවත්ත | 06 |
| බම්බලපිටිය | 07 |
| හැව්ලොක් ටවුම | 08 |
| නුගේගොඩ | 09 |
| කෝට්ටේ | 10 |
| බත්තරමුල්ල | 11 |
| මොරටුව | 12 |
| පිළියන්දල | 13 |
| හෝමාගම | 14 |
| මහරගම | 15 |
| හංවැල්ල | 16 |
| අවිස්සාවේල්ල | 17 |

### ගම්පහ දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මීගමුව | 26 |
| සීදුව | 27 |
| කොච්චිකඩේ | 28 |
| මිනුවන්ගොඩ | 29 |
| දිවුලපිටිය | 30 |
| වේයන්ගොඩ | 31 |
| මීරිගම | 32 |
| ගම්පහ | 33 |
| ගණේමුල්ල | 34 |
| නිට්ටඹුව | 35 |
| ජාඇල | 36 |
| වත්තල | 37 |
| රාගම | 38 |
| කැලණිය | 39 |
| මහර | 40 |
| දෙම්පේ | 41 |
| කිරිදිවැල | 42 |

### කළුතර දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| හොරණ | 51 |
| බුලත්සිංහල | 52 |
| පානදුර | 53 |
| බණ්ඩාරගම | 54 |
| කළුතර | 55 |
| බේරුවල | 56 |
| මතුගම | 57 |
| අගලවත්ත | 58 |
| කඹුරාවල | 59 |
| අළුත්ගම | 60 |

### මාතලේ දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මාතලේ | 71 |
| ගලේවෙල | 72 |
| නාඋල | 73 |
| ලග්ගල පල්ලේගම | 74 |
| දඹුල්ල | 75 |

### මහනුවර දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මහනුවර | 81 |
| කඩුගන්නාව | 82 |
| දෙල්තොට | 83 |
| තලාතුඔය | 84 |
| පිළිමතලාව | 85 |
| කටුගස්තොට | 86 |
| තෙල්දෙණිය | 87 |
| වත්තේගම | 88 |
| උඩුදුම්බර | 89 |
| පූජාපිටිය | 90 |
| හසලක | 91 |
| නුගවෙල | 92 |
| ගලගෙදර | 93 |
| ගම්පොළ | 94 |
| නාවලපිටිය | 95 |
| අලවතුගොඩ | 96 |
| අකුරණ | 97 |
| පේරාදෙණිය | 98 |

### නුවරඑළිය දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| හඟුරන්කෙත | 101 |
| නුවරඑළිය | 102 |
| වලපනේ | 103 |
| හැටන් | 104 |
| ගිනිගත්හේන | 105 |
| හඟුරන්කෙත | 106 |

### ගාල්ල දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| අම්බලන්ගොඩ | 111 |
| බලපිටිය | 112 |
| කරන්දෙණිය | 113 |
| ගාල්ල | 114 |
| හබරාදූව | 115 |
| තවලම | 116 |
| බද්දේගම | 117 |
| ඇල්පිටිය | 118 |
| නාගොඩ | 119 |
| බෙන්තොට | 120 |
| ගිංතොට | 121 |
| අහංගම | 122 |
| උනවටුන | 123 |
| උඩුගම | 124 |

### මාතර දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| වැලිගම | 125 |
| මාතර | 126 |
| කඹුරුපිටිය | 127 |
| හක්මණ | 128 |
| දෙයියන්දර | 129 |
| දෙවිනුවර | 130 |
| දික්වැල්ල | 131 |
| අකුරැස්ස | 132 |
| කොටපොල | 133 |
| දෙනියාය | 134 |

### හම්බන්තොට දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| බෙලිඅත්ත | 141 |
| ගැටමාන්න | 142 |
| වලස්මුල්ල | 143 |
| කටුවන | 144 |
| වීරකැටිය | 145 |
| තංගල්ල | 146 |
| නාකුළුගමුව | 147 |
| අම්බලන්තොට | 148 |
| අගුණකොළපැලැස්ස | 149 |
| හුංගම | 150 |
| හම්බන්තොට | 151 |
| තිස්සමහාරාමය | 152 |
| ලුණුගම්වෙහෙර | 153 |
| සූරියවැව | 154 |

### යාපනය දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| චාවකච්චේරිය | 161 |
| යාපනය | 162 |
| ඩෙල්ෆ්ට් | 163 |
| කෝපායි | 164 |
| කරවෙඩ්ඩි | 165 |
| තෙල්ලිප්පලෙයි | 166 |
| පේදුරුතුඩුව | 167 |

### කිලිනොච්චිය දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| කිලිනොච්චිය | 171 |
| පලෙයි | 172 |

### මන්නාරම් දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මන්නාරම | 176 |
| මුරුන්කන් | 177 |
| මඩු | 178 |

### මුලතිව් දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මුලතිව් | 186 |
| මුල්ලියාවලෙයි | 187 |
| පුතුකුඩිඉරුප්පු | 188 |
| මල්ලාවි | 189 |
| යෝගපුරම් | 190 |

### වව්නියාව දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| වව්නියාව | 196 |
| ඕමන්තෙයි | 197 |

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| කන්තලේ | 206 |
| ත්‍රිකුණාමලය | 207 |
| මුත්තූර් | 208 |
| කින්නියා | 209 |
| පුල්මුඩේ | 210 |

### මඩකලපුව දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මඩකලපුව | 216 |
| එරාවූර් | 217 |
| කාත්තන්කුඩි | 218 |
| වාලච්චනෙයි | 219 |
| කලුවංචිකුඩි | 220 |
| වෙන්කලඩි | 221 |
| ඔට්ටමාවඩි | 222 |

### අම්පාර දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| අම්පාර | 231 |
| දමන | 232 |
| උහන | 233 |
| දෙහිඅත්තකණ්ඩිය | 234 |
| සේරන්කඩ | 235 |
| පොතුවිල් | 236 |
| කල්මුනේ | 237 |
| අක්කරෙයිපත්තු | 238 |
| සම්මන්තුරේ | 239 |
| නින්දවූර් | 240 |
| තිරුක්කෝවිල් | 241 |

### පුත්තලම් දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| වෙන්නප්පුව | 251 |
| දංකොටුව | 252 |
| මාදම්පේ | 253 |
| හලාවත | 254 |
| මාරවිල | 255 |
| නාත්තන්ඩිය | 256 |
| පුත්තලම | 257 |
| මුන්දලම | 258 |
| ආණමඩුව | 259 |
| කල්පිටිය | 260 |

### කුරුණෑගල දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| කුලියාපිටිය | 266 |
| බිංගිරිය | 267 |
| හෙට්ටිපොල | 268 |
| පන්නල | 269 |
| නාරම්මල | 270 |
| ගිරිඋල්ල | 271 |
| පොල්ගහවෙල | 272 |
| කුරුණෑගල | 273 |
| ඉබ්බාගමුව | 274 |
| දෙඩන්ගස්ලන්ද | 275 |
| මොරතිහ | 276 |
| මාවතගම | 277 |
| වාරියපොළ | 278 |
| නිකවැරටිය | 279 |
| කොබෙයිගනේ | 280 |
| මහව | 281 |
| ගල්ගමුව | 282 |
| අලව්ව | 283 |

### අනුරාධපුරය දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| මැදවච්චිය | 291 |
| පදවිපරාක්‍රමපුර | 292 |
| කැකිරාව | 293 |
| ගල්නෑව | 294 |
| අනුරාධපුරය | 295 |
| ගලෙන්බිඳුනුවැව | 296 |
| කහටගස්දිගිලිය | 297 |
| නොච්චියාගම | 298 |
| තඹුත්තේගම | 299 |
| කැබිතිගොල්ලෑව | 300 |
| රඹෑව | 301 |
| මිහින්තලය | 302 |
| හොරොව්පතාන | 303 |
| පදවිය | 304 |

### පොළොන්නරුව දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| පොළොන්නරුව | 306 |
| හිඟුරක්ගොඩ | 307 |
| මනම්පිටිය | 308 |
| බකමූණ | 309 |
| මැදිරිගිරිය | 310 |
| ගිරිතලේ | 311 |

### බදුල්ල දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| බණ්ඩාරවෙල | 316 |
| හල්දුම්මුල්ල | 317 |
| වැලිමඩ | 318 |
| බදුල්ල | 319 |
| පස්සර | 320 |
| මහියංගනය | 321 |
| ගිරාඳුරුකෝට්ටේ | 322 |
| හාලිඇල | 323 |
| අඹගස්දෝව | 324 |

### මොනරාගල දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| බිබිල | 331 |
| මොනරාගල | 332 |
| වැල්ලවාය | 333 |
| බඩල්කුඹුර | 334 |
| බුත්තල | 335 |

### කෑගල්ල දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| කෑගල්ල | 341 |
| දරණියගල | 342 |
| දෙහිඕවිට | 343 |
| රඹුක්කන | 344 |
| මාවනැල්ල | 345 |
| වරකාපොල | 346 |
| හෙම්මාතගම | 347 |
| අරණායක | 348 |
| රුවන්වැල්ල | 349 |
| යටියන්තොට | 350 |

### රත්නපුර දිස්ත්‍රික්කය

| නගරය | නගර අංකය |
|---|---|
| ඇහැලියගොඩ | 356 |
| රත්නපුර | 357 |
| පැල්මඩුල්ල | 358 |
| ගොඩකවෙල | 359 |
| බලංගොඩ | 360 |
| කලවාන | 361 |
| නිවිතිගල | 362 |
| ඇඹිලිපිටිය | 363 |

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2017
## යෝජිත කාලසටහන

| දවස | උදය වරුව | සවස් වරුව |
|---|---|---|
| 1 | **0830 - 1130**<br>10 සංයුක්ත ගණිතය I<br>**0830 - 1030**<br>78 අරාබි I | **1230 - 1430**<br>09 ජීව විද්‍යාව I<br>21 ආර්ථික විද්‍යාව I<br>79 මැලේ I |
| 2 | **0830 - 1030**<br>52 නර්තනය - දේශීය I<br>53 නර්තනය - භරත I<br>54 පෙරදිග සංගීතය I<br>55 කර්ණාටක සංගීතය I<br>56 බටහිර සංගීතය I<br>**0830 - 1130**<br>51 චිත්‍ර කලාව I | **1230 - 1530**<br>09 ජීව විද්‍යාව II<br>21 ආර්ථික විද්‍යාව II<br>79 මැලේ II |
| 3 | **0830 - 1030**<br>65 ඉංජිනේරු තාක්ෂණවේදය I<br>66 ජෛව පද්ධති තාක්ෂණවේදය I<br>**0830 - 1130**<br>10 සංයුක්ත ගණිතය II<br>52 නර්තනය - (දේශීය) II<br>53 නර්තනය - (භරත) II<br>78 අරාබි II | **1230 - 1430**<br>08 කෘෂි විද්‍යාව I<br>48 ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය I<br>83 රුසියන් I |
| 4 | **0830 - 1030**<br>32 ව්‍යාපාර අධ්‍යයනය I<br>82 ජර්මන් I<br>86 චීන I | **1400 - 1700**<br>51 චිත්‍ර කලාව II<br>54 පෙරදිග සංගීතය II<br>55 කර්ණාටක සංගීතය II<br>56 බටහිර සංගීතය II |
| 5 | **0830 - 1030**<br>01 භෞතික විද්‍යාව I<br>**0830 - 1130**<br>32 ව්‍යාපාර අධ්‍යයනය II<br>82 ජර්මන් II | **1230 - 1530**<br>65 ඉංජිනේරු තාක්ෂණවේදය II<br>66 ජෛව පද්ධති තාක්ෂණවේදය II<br>71 සිංහල I<br>72 දෙමළ I |
| 6 | **0830 - 1130**<br>08 කෘෂි විද්‍යාව II<br>48 ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය II<br>83 රුසියන් II<br>86 චීන II | **1230 - 1430**<br>28 ගෘහ ආර්ථික විද්‍යාව I |
| 7 | **0830 - 1130**<br>01 භෞතික විද්‍යාව II<br>51 චිත්‍ර කලාව III | **1230 - 1530**<br>71 සිංහල II<br>72 දෙමළ II |
| 8 | **0830 - 1030**<br>24 තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය I | **1230 - 1530**<br>28 ගෘහ ආර්ථික විද්‍යාව II |
| 9 | **0830 - 1030**<br>02 රසායන විද්‍යාව I<br>67 තාක්ෂණවේදය සඳහා විද්‍යාව I<br>75 සංස්කෘත I<br>81 ප්‍රංශ I | **1230 - 1530**<br>24 තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය II |
| 10 | **0830 - 1030**<br>14 සිවිල් තාක්ෂණවේදය I<br>15 යාන්ත්‍රික තාක්ෂණවේදය I<br>16 විදුලිය, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය I<br>17 ආහාර තාක්ෂණවේදය I<br>18 කෘෂි තාක්ෂණවේදය I<br>19 ජෛව සම්පත් තාක්ෂණවේදය I<br>74 පාලි I | **1400 - 1700**<br>25 A ඉන්දීය ඉතිහාසය II<br>25 B යුරෝපා ඉතිහාසය II<br>25 C නූතන ලෝක ඉතිහාසය II |
| 11 | **0830 - 1130**<br>02 රසායන විද්‍යාව II<br>67 තාක්ෂණවේදය සඳහා විද්‍යාව II<br>75 සංස්කෘත II<br>81 ප්‍රංශ II | **1230 - 1430**<br>23 දේශපාලන විද්‍යාව I |
| 12 | **0830 - 1130**<br>13 සාමාන්‍ය ඉංග්‍රීසි I | **1230 - 1500**<br>13 සාමාන්‍ය ඉංග්‍රීසි II |
| 13 | **0830 - 1030**<br>41 බුද්ධ ධර්මය I<br>42 හින්දු ධර්මය I<br>43 ක්‍රිස්තියානි ධර්මය I<br>44 ඉස්ලාම් I<br>45 බෞද්ධ ශිෂ්ටාචාරය I<br>46 හින්දු ශිෂ්ටාචාරය I<br>47 ඉස්ලාම් ශිෂ්ටාචාරය I<br>49 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I | **1230 - 1430**<br>29 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I |
| 14 | **0830 - 1130**<br>73 ඉංග්‍රීසි I | **1230 - 1530**<br>25 ශ්‍රී ලංකා ඉතිහාසය I |
| 15 | **0830 - 1130**<br>14 සිවිල් තාක්ෂණවේදය II<br>15 යාන්ත්‍රික තාක්ෂණවේදය II<br>16 විදුලිය, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය II<br>17 ආහාර තාක්ෂණවේදය II<br>18 කෘෂි තාක්ෂණවේදය II<br>19 ජෛව සම්පත් තාක්ෂණවේදය II<br>74 පාලි II | **1230 - 1430**<br>22 භූගෝල විද්‍යාව I |
| 16 | **0830 - 1130**<br>23 දේශපාලන විද්‍යාව II | **1400 - 1700**<br>73 ඉංග්‍රීසි II |
| 17 | **0830 - 1030**<br>33 ගිණුම්කරණය I<br>84 හින්දි I | **1230 - 1530**<br>22 භූගෝල විද්‍යාව II |
| 18 | **0830 - 1130**<br>41 බුද්ධ ධර්මය II<br>42 හින්දු ධර්මය II<br>43 ක්‍රිස්තියානි ධර්මය II<br>44 ඉස්ලාම් II<br>45 බෞද්ධ ශිෂ්ටාචාරය II<br>46 හින්දු ශිෂ්ටාචාරය II<br>47 ඉස්ලාම් ශිෂ්ටාචාරය II<br>49 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II | **1230 - 1530**<br>29 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II |
| 19 | **0830 - 1130**<br>33 ගිණුම්කරණය II<br>84 හින්දි II | **1230 - 1430**<br>20 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I |
| 20 | **0830 - 1030**<br>31 ව්‍යාපාර සංඛ්‍යානය I<br>**0830 - 1130**<br>57 නාට්‍ය හා රංග කලාව (සිංහල) I<br>58 නාට්‍ය හා රංග කලාව (දෙමළ) I<br>59 නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) I | **1230 - 1530**<br>07 ගණිතය I<br>11 උසස් ගණිතය I<br>**1230 - 1430**<br>87 ජපන් I |
| 21 | **0830 - 1130**<br>31 ව්‍යාපාර සංඛ්‍යානය II<br>57 නාට්‍ය හා රංග කලාව (සිංහල) II<br>58 නාට්‍ය හා රංග කලාව (දෙමළ) II<br>59 නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) II | **1230 - 1530**<br>07 ගණිතය II<br>11 උසස් ගණිතය II<br>87 ජපන් II |
| 22 | **0830 - 1100**<br>12 සාමාන්‍ය පොදු පරීක්ෂණය | **1230 - 1530**<br>20 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II |

සැ. යු : මෙම විභාගයේ කිසිදු විෂයයක් සඳහා ගණක යන්ත්‍ර හෝ මකන දියර (Correcting fluid) හෝ ජංගම දුරකථන, ස්මාට් ඔරලෝසු හෝ ඉලෙක්ට්‍රොනික උපාංග හෝ භාවිත කිරීමට ඉඩ දෙනු නොලබන අතර ඒවා ශාලාව තුළට රැගෙන ඒමද දඬුවම් ලැබිය හැකි වරදකි.

**මගේ අංකය : 6/3/උ. පෙළ/2017**
**පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල.**
**2017-01-18**

**ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර**
**විභාග කොමසාරිස් ජනරාල්.**